Sarvodaya ICT4D Movement

# DIPOMA IN COMPUTER SCIENCE
# FINAL EXAMINATION 2025 / 2026

Practical Paper

Answer **only one** question.

---

## 01. ප්‍රශ්නය:

**විදුලි බිල්පත් ගණනය කිරීමේ පද්ධතිය**

පරිශීලකයා විසින් භාවිතා කරන ලද විදුලි ඒකක (Electricity Units) ප්‍රමාණය ඇතුළත් කළ විට, ඒ සඳහා ගෙවිය යුතු මුළු මුදල ගණනය කර පෙන්වන C++ වැඩසටහනක් සාදන්න.

1. පරිශීලකයා ඒකක ප්‍රමාණය ලෙස අකුරු හෝ සංකේත ඇතුළත් කරන්නේ නම් "අවලංගු ආදානයකි" (Invalid Input) යන පණිවිඩය පෙන්වන්න.
2. ඒකක ප්‍රමාණය 0 ට වඩා අඩු නම් "ඒකක ප්‍රමාණය සෘණ විය නොහැක" ලෙස පෙන්වන්න.
3. පහත සඳහන් ගාස්තු ක්‍රමය අනුව බිල්පත ගණනය කරන්න:
    - ඒකක 0 – 60 දක්වා → ඒකකයකට රු. 25.00
    - ඒකක 61 – 120 දක්වා → ඒකකයකට රු. 35.00
    - ඒකක 120 ට වැඩි → ඒකකයකට රු. 50.00
4. සෑම බිල්පතකටම රු. 500.00 ක ස්ථාවර ගාස්තුවක් (Fixed Charge) එකතු කර අවසන් මුදල ප්‍රදර්ශනය කරන්න.

## 02. ප්‍රශ්නය :

**සංචාරක ගමනාන්තය පිළිබඳ වෙබ් පිටුවක් නිර්මාණය කිරීම**

ශ්‍රී ලංකාවේ ඔබ වඩාත්ම කැමති **සංචාරක ස්ථානයක්** (උදා: සීගිරිය, ඇල්ල, ගාල්ල කොටුව) පිළිබඳව HTML සහ CSS භාවිතයෙන් සරල වෙබ් අඩවියක් සාදන්න.

- **HTML ඡේද (Paragraphs)** භාවිතයෙන් එම ස්ථානයේ ඓතිහාසික හෝ ස්වභාවික වැදගත්කම විස්තර කරන්න.
- එම ස්ථානයට සංචාරය කරන අයෙකු රැගෙන යා යුතු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලැයිස්තුවක් (Ordered or Unordered List) ඇතුළත් කරන්න.
- එම ස්ථානයේ ආකර්ෂණීය **ඡායාරූපයක්** එක් කරන්න.

- ගූගල් සිතියමකට (Google Maps) හෝ වැඩිදුර විස්තර ඇතුළත් වෙබ් අඩවියකට **සබැඳියක් (Link)** ලබා දෙන්න.
- පිටුව වඩාත් ආකර්ෂණීය කිරීමට **CSS** භාවිතා කර වර්ණ, අකුරු වර්ග (Fonts) සහ පිරිසැලසුම (Layout) සකසන්න.

---

**සංචාරක පැකේජ විස්තර කිරීම (වගු භාවිතයෙන්)**
ඔබේ සංචාරක ආයතනයක් සඳහා වෙබ් පිටුවක් නිර්මාණය කරන්න.

- එහි ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක කලාප (මධ්‍යම කඳුකරය, දකුණු වෙරළ තීරය, සංස්කෘතික ත්‍රිකෝණය) විස්තර කරන්න.
- **HTML Table** එකක් භාවිතයෙන් විවිධ සංචාරක පැකේජ, ඒවායේ මිල ගණන් සහ කාලසීමාවන් දක්වන්න.
- පසුබිම් වර්ණ (Background colors) සහ Border Styles යොදා ගනිමින් පිටුව හැඩගන්වන්න.

---